**මහ කොළඹ ජල පුනරුත්ථාපන ව්‍යාපෘතිය - 2017**

**-----------------------------------------------------**

මහ කොළඹ ජල පුනරුත්ථාපන ව්‍යාපෘතියේ 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය සහ ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය අතර 2008 සැප්තැම්බර් 03 දින එළඹි අංක එස්එල්-පී 90 දරන අතුරු ණය ගිවිසුමේ IV ව්‍යවස්ථාවේ 4.03(අ) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. වර්තමානයේ ජාත්‍යන්තර සහයෝගීතාව පිළිබඳ ජපාන නියෝජිතායතනය (ජාසජනි) ලෙස හඳුන්වනු ලබන ජාත්‍යන්තර සහයෝගීතාව පිළිබඳ ජපන් බැංකුව (ජාසපිජබැ) සහ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය අතර 2007 මාර්තු 28 දින එළඹි අංක එස්එල්-පී 90 දරන ණය ගිවිසුම යටතේ මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක වේ. පාර්ලිමේන්තුවට වාර්තා කළයුතු යැයි සළකන මාගේ අදහස් සහ නිරීක්ෂණ මෙම වාර්තාවේ දැක්වේ.

**1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය**

ව්‍යාපෘතියේ ණය ගිවිසුම අනුව, එවකට ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍යාංශය, වර්තමානයේ නගර සැලසුම්, ජල සම්පාදන සහ උසස් අධ්‍යාපන අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. මාළිගාකන්දේ නව කාර්යාල ගොඩනැගිලි සංකීර්ණයක් හා නව ජලාශයක් ඉදිකිරීම, එලිහවුස් හි ජලාශයක් ඉදිකිරීම, කොට්කාවත්ත හා මුල්ලේරියාව ප්‍රදේශවල ජල සැපයුම පුළුල් කිරීම සහ කොළඹ තෝරාගත් වතු නිවාස සඳහා ජල සම්බන්ධතා ලබා දීම මඟින් කොළඹ නගරයේ හා කොට්කාවත්ත - මුල්ලේරියාව ප්‍රදේශවල ජල සම්පාදනය ප්‍රතිසංස්කරණය හා පුළුල් කිරීම ව්‍යාපෘතියේ අරමුණ වේ. ණය ගිවිසුම අනුව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය වටිනාකම රු.මිලියන 4,785 කට සමාන ජපන් යෙන් මිලියන 5,359 ක් වූ අතර ඉන් රු.මිලියන 3,549 කට සමාන ජපන් යෙන් මිලියන 3,975 ක් ජාත්‍යන්තර සහයෝගීතාව පිළිබඳ ජපාන නියෝජිතායතනය විසින් ලබා දීමට එකඟ වී තිබුණි. ඉතිරි ශේෂ වටිනාකම වන රු.මිලියන 1,236 කට සමාන ජපන් යෙන් මිලියන 1,384 ක් ශ්‍රී ලංකා රජය විසින් ලබාදීමට එකඟ වී තිබුණි. ව්‍යාපෘතිය එහි කටයුතු 2007 නොවැම්බර් 27 දින ආරම්භ කරන ලද අතර 2012 ජනවාරි වන විට නිම කිරීමට නියමිත විය. පසුව, ව්‍යාපෘති කාලය 2017 ජූනි 20 දක්වා දීර්ඝ කර තිබුණි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

**1.4 විගණකගේ වගකීම**

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි. මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළ වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස වැඩසටහනේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස

ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීම ද විගණනයට ඇතුළත් වේ. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි. පහත සඳහන් දෑ තක්සේරු කිරිමෙහිලා අවශ්‍ය යැයි සලකනු ලැබූ එවැනි පරීක්ෂා කිරීම්ද එම පරීක්ෂණයට ඇතුළත් විය.

(අ) අභ්‍යන්තර පාලන අංශයෙන් බලන කල ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ සතුටුදායක පාලනයක් සහ වැඩසටහනේ මෙහෙයුම්වලට අදාළ පොත්පත්, වාර්තා ආදියේ විශ්වාසවන්තභාවය තහවුරු වනු පිණිස පද්ධති සහ පාලන ප්‍රමාණවත් වූයේද යන බව.

(ආ) ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන වියදම ව්‍යාපෘතිය විසින් පවත්වා ගෙන යන ලද වැඩිදියුණු කළ මූල්‍ය වාර්තා හා ප්‍රගති වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණේද යන බව,

(ඇ) ශ්‍රී ලංකා රජය හා ණය සපයනු ලබන නියෝජිතායතනය විසින් සපයන ලද අරමුදල්වලින් දරන ලද ව්‍යාපෘතියේ වියදම්, මූල්‍ය හා භෞතික වශයෙන් ව්‍යාපෘතියේ ප්‍රගතිය, ව්‍යාපෘතියේ මෙහෙයුම් කටයුතුවලින් උද්ගත වූ වත්කම් සහ වගකීම්, ණයවලින් කරන ලද මිලදී ගැනීම් හඳුනාගැනීම ආදිය දැක්වෙන පරිදි අඛණ්ඩ පදනමක් මත ප්‍රමාණවත් ගිණුම් වාර්තා පවත්වා ගනු ලැබුවේද යන බව.

(ඈ) ණය යටතේ ආපසු ගැනීම් ණය ගිවිසුම්වල දක්වා ඇති පිරිවිතරයන්ට අනුකූලව සිදුකර තිබුණේද යන බව.

(ඉ) ණය යටතේ සපයන ලද අරමුදල්, ද්‍රව්‍ය හා උපකරණ ව්‍යාපෘතියේ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණේද යන බව.

(ඊ) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා යොදාගන්නා ලද වර්ගීකරණයට අනුව වියදම නිවැරදිව හඳුනාගෙන තිබුණේද යන බව.

(උ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබුණේද යන බව.

(ඌ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීම සඳහා කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණේද යන බව, සහ

(එ) ණය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූයේද යන බව.

## 1.5 තත්ත්වාගණනය කළ විගණන මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 මතය

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව, මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් උද්ගත වන ගැලපීම්වලින් ඇතිවන බලපෑම් හැර මාගේ මතය වනුයේ,

(අ) 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘතිය නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව හා 2017 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ ක්‍රියාකාරීත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව,

(ආ) සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණු බව,

(ඇ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීම සඳහා කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණු බව, සහ

(ඈ) ණය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වී තිබුණු බවත්ය.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 2.2.1 ගිණුම්කරණ අඩුපාඩු

2017 දෙසැම්බර් දින 31 දක්වා ගෙවන ලද එකතු කළ අගය මත බදු වටිනාකම රු.මිලියන 481.11 ක් ශ්‍රී ලංකා රජයෙන් ලත් දායකයට එරෙහිව හිලව් කර තිබුණි.

#### 2.2.2 නීති, රීති හා රෙගුලාසි වලට අනුකූල නොවීම

ව්‍යාපෘතියේ කාර්යය නිම කිරීමේ ප්‍රමාදය මත 2017 ජූනි 20 දක්වා ව්‍යාපෘති කාලය දෙවරක් දීර්ඝ කර තිබුණි. තවද, 2015 ජූනි 20 දින වන විට ණය අවසන්වීම මත ඉතිරි ඉදි කිරීම් කාර්යය අවසන් කිරීම සඳහා එකතුව රු.මිලියන 346.59 ක් කොන්ත්‍රාත්කරුගේ පෞද්ගලික ගිණුමට බැර කර තිබූ බව නිරීක්ෂණය විය. කෙසේ වුවද, ඒ සඳහා විදේශ සම්පත් දෙපාර්තමේන්තුවෙන් අනුමැතිය ලබා ගෙන නොතිබුණි. ඉහත ගෙවීම් යාන්ත්‍රනය අනුව කොන්ත්‍රාත්කරු විසින් ගෙවීම් විස්තර සමග බැංකු ප්‍රකාශන ව්‍යාපෘතියට ලබා දිය යුතුය. කෙසේ වුවද, කොන්ත්‍රාත්කරු විසින් අදාල බැංකු ගිණුමේ මාසික බැංකු ප්‍රකාශන ලබා දී නොතිබුණි.

#### 2.2.3 නොසැසඳූ ශේෂ

ජාතික ජල සම්පාදන හා ජලපවහන මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන අනුව ව්‍යාපෘතියේ 2017 දෙසැම්බර් දිනට 31 කෙරීගෙන යන වැඩවල වටිනාකම රු.මිලියන 3,396.95ක් විය. කෙ◌ෙස් වුවද ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන අනුව 2017 දෙසැම්බර් 31 දිනට, කෙරීගෙන යන වැඩවල වටිනාකම රු.මිලියන 3,393.55 ක් විය.

## 3. මූල්‍ය හා භෞතික කාර්යසාධනය

### 3.1 අරමුදල් උපයෝජනය

මූල්‍යයනය, සමාලෝචිත වර්ෂය සඳහා අයවැයගත ප්‍රතිපාදනය සහ සමාලෝචිත වර්ෂය තුළ දී හා 2017 දෙසැම්බර් 31 දින දක්වා අරමුදල් උපයෝජනය පිළිබඳ වැදගත් සංඛ්‍යා ලේඛන කිහිපයක් පහත දැක්වේ.

| ප්‍රභවය | ණය ගිවිසුම අනුව මූල්‍යයනය සඳහා එකඟ වූ මුදල | | සමාලෝචිත වර්ෂය සඳහා අයවැය ඇස්තමේන්තුවේ කරනලද වෙන්කිරීම | උපයෝජනය කළ අරමුදල් – සමාලෝචිත වර්ෂය තුළ | | උපයෝජනය කළ අරමුදල් – 2017 දෙසැම්බර් 31 දිනට | |
|---|---|---|---|---|---|---|---|
| | ජපන් යෙන් මිලියන | රු.මිලියන | රු.මිලියන | ජපන් යෙන් මිලියන | රු.මිලියන | ජපන් යෙන් මිලියන | රු.මිලියන |
| ජාසජනි | 3,975.00 | 3,549.00 | _ | _ | _ | 3,138.00 | 4,152.00 |
| ශ්‍රී ලං ර | 1,384.00 | 1,236.00 | _ | 11.12 | 14.56 | 858.26 | 1,135.60 |
| එකතුව | 5,359.00 | 4,785.00 | _ | 11.12 | 14.56 | 3,996.26 | 5,287.60 |

ඉහත දැක්වෙන තොරතුරු අනුව ණය ගිවිසුම මඟින් සිදු කළ රු.මිලියන 3,549 කට සමාන ජපන් යෙන් මිලියන 3,975 ක වෙන්කිරීම් අතරින් ව්‍යාපෘති ණය ගිවිසුම් දින සිට වර්ෂ 09 ක් අවසන් වන විට රු.මිලියන 4,152 කට සමාන ජපන් යෙන් මිලියන 3,138 ක් පමණක් උපයෝජනය කර තිබුණි. තවද 2017 වර්ෂය සඳහා අයවැය ඇස්තමේන්තුවෙ හි මුදල් වෙන් කර නොතිබුණද ව්‍යාපෘති ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කිරීමට එකතුව රු.මිලියන 14.56 ක් සමාලෝචිත වර්ෂය තුළදී වැය කර තිබුණි.

### 3.2 භෞතික ප්‍රගතිය

ව්‍යාපෘතිය විසින් ඉදිරිපත් කරන ලද ප්‍රගති වාර්තා අනුව, සමාලෝචිත වර්ෂය අග වන විට ජලාශ හා ගොඩනැගිලි ඉදි කිරීම් සහ ජල සම්බන්ධතා ලබා දීම් වැනි කාර්යය සම්පූර්ණයෙන් නිම කර තිබුණි.

### 3.3 පෙර විගණනයෙන් පෙන්වා දෙන ලද නොවිසඳුණු විගණන ගැටලු

පෙර වර්ෂ වල විගණන වාර්තාවල පෙන්වා දුන් පහත නිරීක්ෂණ සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් නොවිසඳී පැවතුණි.

(අ) මාර්ග යලි ස්ථාපිත කිරීමේ වැඩ සඳහා 2013 වර්ෂයේදී පලාත් මාර්ග සංවර්ධන අධිකාරියේ තැන්පත් කළ වටිනාකම රු. මිලියන 11.9 ක් වූ ආපසු ගෙවීමේ තැන්පතුවල වලංගු කාලය අවසන් වී තිබුණද 2017 දෙසැම්බර් 31 දින වන විටත් මුදල් කර ගෙන නොතිබුණි.

(ආ) 2001 වර්ෂයේදී ජල කුළුණක් හා කාර්යාල ගොඩනැගිල්ලක් ඉදි කිරීම සඳහා කොලොන්නාව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් කල් බදු පදනම මත ලබා ගත් ඉඩමක් සඳහා 2017 දෙසැම්බර් 31 දක්වා ව්‍යාපෘතිය විසින් කල්බදු ගිවිසුමකට එළඹීමකින් තොරව එකතුව රු. මිලියන 5.17 ක් ගෙවා තිබුණි.

### 3.4 මූල්‍ය පාලන ගැටලු

1978 දෙසැම්බර් 19 දිනැති මුදල් අමාත්‍යාංශ චක්‍රලේඛ අංක 842 හි අවශ්‍යතාවයන්ට අනුව, ව්‍යාපෘතිය විසින් යාවත්කාලීන කල ස්ථාවර වත්කම් ලේඛනයක් නඩත්තු කර නොතිබුණි.